THE SINHALA - DEC. 2015
ISSN : 1834-7061
THE SCF-NSW

# අතීතයේ වසන්තයක්

තව දින දෙකකින් මුද්‍රණයට බාර දීමට පොරොන්දු වූ 'සඳ පායන තුරු' නවකතාවේ අවසන් පිටපත සකස් කරමින් කල්පනා සාගරයේ පතුලටම කිමිදී සිටි රංගට ධම්මි කීවේ කුමක්දැයි සිතා ගැනීමටවත් බැරි ය. දින දෙකක් කාර්යාලයෙන් නිවාඩු ලබා ගත්තේ කෙසේ හෝ සඳුදා දවල් 12ට පෙර මෙය බාර දෙන බවට පොරොන්දු වීමෙන්. පසු ගිය දින කිහිපය තුල නිදි මැරීම නිසා රංගට දැනුනේ දැඩි කෙඩෙත්තු ගතියක්.

'ආ රංග මේ ආත කැල්ලක් කන්නකො. හරිම රහයි. චූටි නැන්දා ගෙනැල්ල දුන්නා ඔයාටම දෙන්න කියලා.' ධම්මි නොනැවතී කියාගෙන යයි.

රංගගේ හිත සැනෙකින් කුඩා කලට දිවීය. කුඩා කළ සිටම ආත කෑමට ඉතා ප්‍රිය බවක් ඇති වූයේ ඇයි දැයි ඔහුට සිතා ගත නොහැක. ඉස්සර නැන්දලාගේ ගෙදර ගිය විට හිම්හිට රංග දුව යන්නේ ආත ගස්වලින් පිරිච්ච වත්ත පහලට.

ආත පිඟානක් රැගෙන පිටුපසින් පැමිණි ධම්මිව ඔහු තුරුළු කර ගත්තේ සෙනෙහසින්. ධම්මි ඔහුට තව තවත් තුරුළු වූයේ ඉබේටම. ටික වේලාවක් ගත විය.

'අනේ රංග, දැන් පුතා ඒවි' කිසිවත් හදිසියේ මතක් වීමෙන් ඇය නැගී සිටියා ය.

'ඔයා හිතාගෙන ඉන්නෙ අපි ඊයෙ පෙරේදා බැන්දා කියල වාගේ. දැන් ලොකු ළමයි දෙන්නෙකුත් ඉන්නවා' කියූ ඇය හඬ නඟා සැහැල්ලු ලෙස හිනාවුනි. රංගගේ සිත නැවතත් අතීතයට දිව ගියා.

'ධම්මි ඔයාගෙ ආත කැවීම නිසා මට මතකයට ආවා පොඩි කාලෙදි සිද්ධ උන ආතවලට සම්බන්ධ කතාවක්. මං හිතන්නේ ඒකත් හොඳ කතාවකට ගොතන්න පුළුවන් වේවි.'

'අනේ රංග ඒක එහෙනම් මට දැන්මම කියන්න.' ඇය හරි බරි ගැහී වාඩි වූයේ දිග සුරංගනා කතාවක් ඇසීමට සැරසෙන කුඩා දැරියක් වගේ. රංගගේ කතා කියවා රස විඳීමත්, සුදුසු ලෙස විවේචනයක් ලබා දීමත් නිසා රංග ලිවූ සෑම කතාවක්ම පාහේ ඇය සමග සාකච්ඡා විය

'මම කරන වැඩෙන් පොඩි බ්‍රේක් එකක් ගන්නත් එක්කම ඒ කතාව කියන්නම්.' කී රංග ධම්මි අසළින් වාඩි වුනා.

කුඩා කාලය ගත කළ මහගෙදරත්, ගමත්, යාලුවනුත් මතකයට නගා ගත් රංගට පාසැල් අවදියට යාමට ගත වූයේ සුලු මොහොතක්. මහ ගෙදරට දකුණු පැත්තේ කිලෝමීටර් 4-5 පමණ දුවන සරුසාර කුඹුරු යාය, ගෙට පසු පසින් හෙමිහිට ගලා බසිමින් ගොඩමඩ සරුකරන කොස්කොළ ඔය. ඒ මැද්දෙ තිබුණු පුංචි දූපත.... ඒකෙ පවුල් කීපයක් පදිංචිව හිටියා. මේ පැත්තෙ ඉඳලා ඒ දූපතට පීනන්න පුළුවන්. ඒකෙ කිරල, අඹ, පේර කජු පුහුලන්, ලොවි, වරකා, ආත වගේ පලතුරු පිරිලා. ඒ වගේම අපේ ගෙට වම් පැත්තෙන් තමයි ගමයි, කඩ මණ්ඩියයි පටන් ගත්තේ.

'ඒක නිකං හරියට අර කටුරොද ගම්මානය වගේනෙ' ධම්මිට පරණ කවියක් මතක් වෙයි.

> ගොඩ මඩ දෙකම සරුසාරය පලබරය
> කටුරොද ගම්මානෙ තරමක පිටිසරය
> ඒ ගම මැදින් ගලනා ගඟ මනහරය
> කඩමණ්ඩිය පිහිටියේ ගම කෙලවරය

තුන් වන පන්තියේදී කියන ලද කවියකින්ම රංග පිළිතුරු දෙයි

> වැන්දඹු අංගො හාමිගෙ සුරතල් දූට
> යන්තම් පස් වසයි විසි අට වෙනිදාට
> දුප්පත් කෙල්ල නොසිටියෙ නම් මේලාට
> සැකයක් නැත අංගො පරාලොව වැඩියාට

'සාගර පලන්සූරියලා වගේ දක්ෂ අය කීයෙන් කීදෙනාද දැන් ඉන්නේ? ඒ ශ්‍රේෂ්ඨයන් සිතුවේ පැතුවේ භාෂාව ජීවත් කරවන්න. තමා ගැන නෙවි. ඒ නිසා තමයි අපිට තුනේ පන්තියෙ ඉගෙන ගත්ත කවි තාමත් මතක.'

'ඉතිං සමහරදාට කොල්ලෝ කීපදෙනෙක් එකතු වෙලා අපි අර දූපතට පීනනවා, පලතුරු කන්න. ඒ දවස්වලත් මම ඉස්සෙල්ලාම යන්නේ ආත පඳුරක් ලඟට. හොඳටම පළතුරු කාලා හිම්හිට ගෙදර එනවා, තාත්තා එන්න ඉස්සර. ඇවිත් හයියෙන් චක්කරේ, කවි පාඩම් කරනවා. මෙහෙම හයියෙන් පාඩම් කරනවා ඇහුනම අම්මා නිතරම කියනවා 'පොඩි පුතේ. උඹ නම් අද මොකක් හරි හොර වැඩක් කරල වගෙයි. ඒත් කමක් නැහැ. හොඳට පාඩම් කරලා මේ සැරෙත් පළවෙනියා වෙයන්. එතකොට උඹටත් අයියා වගේ ආනන්දෙට යන්න ශිෂ්‍යත්වයක් ගන්න පුළුවන් වේවි' කියලා.

අයියා ආනන්දයේ නේවාසිකාගාරයේ නැවතී ඉන්නා බැවින් ගෙදර හිටියෙ රංගත්, නංගීත් විතරයි. අයියා නම් උත්සාහ කරන්නේ කොහොම හරි ලබන අවුරුද්දෙ පේරාදෙණියට යන්නයි ඉංජිනියරිං කරන්න.

ගමේ පීතර මාමාගෙ බඩු අදින ලොරියයි, ඇසිලින් නැන්දගෙ හයරින් කාර් එකයි හැරුනම ගමේ හැමෝටම පිහිට උනේ ඉඳලා හිටලා දුවන ලංගම බස් එක තමයි.

රංගගෙ ගෙට අනික් පැත්තේ තිබුනෙ කඩයක්. ලිවිනිස් මාමාගේ. එයාලට ළමයි එහෙම නැහැ. සල්ලිය බාගෙ පිරිලා. ඒත් පිනට දහමට හරිම හොරයි. පංසලේ පිංකමකට ආධාරයක් ඉල්ලගෙන ආවොත් හැමදාම කියන්නේ 'අපි පහුගිය ආත්මවල කරල තියෙන පිං හොඳටෝම ඇති තවත් ආත්ම ගනනාවක්ම ගෙනියන්න. ඒත් ඕන්න අපෙනුත් සත පනහක්ම ලියා ගනිල්ලා' කියලා කියන්නෙ මහා දානපතියෙක් වගේ.

මේ කඩේට ගෙවල් තුනකට එහායින් තිබුනා විශාල ඉඩමක්. ආත ගස් වටේටම. ගෙඩි හැමදාම. ඉඩම මැද්දෙ තිබුණ පරණ ලොකු ගෙයක්. මේකෙ හිටියේ ළමයින් නැති සීයා-ආච්චි යුවළක්. මේ සීයාට ගමේ ළමයි හැමෝම කිව්වේ 'ආත සීයා' කියලා. මේකට නියම හේතුව කවුරුවත් දන්නෙ නැහැ. සමහරු නම් කිව්වෙ සීයගේ නම 'ආතර්' නිසා තමයි ආත සීයා උනේ කියලා. ඒත් සමහරු කිව්වෙ එයා තමයි ගමේ ඉන්න වයසකම පුද්ගලයා ඒක නිසා තමයි 'ආතාසීයා' උනේ කියලා. ඒත් අපි නම් ආත සීයා කිව්වෙ ආත ගස් වත්ත වටේම තිබුන නිසා. මේ සීයා නම් හරිම කරුණාවන්තයි. ඒත් ආච්චි නම් හරිම නපුරුයි. ළමයින්ව පේන්නම බැහැ. ආච්චිට නම් සමහරු කිව්වෙ 'නිකා ආච්චි'. ඒ ඇගෙ නම නිකාසියා නිසා වෙන්න ඇති. ඒත් ළමයි නම් කිව්වෙ 'යකා ආච්චි' කියලා. ඒ එයා හරිම නපුරු නිසා. එයා කාටවත් ආත ගහක් දිහා බලන්නවත් දෙන්නෙ නැහැ. ඒත් සීයා නම් ඉඳලා හිටලා ආච්චි නැති වෙලාවට ළමයින්ට ඉදුනු ආත දෙනවා.

එදා සෙනසුරාදා දවසක්. ආච්චි හොඳට ඇඳගෙන උදේම බස් එකෙන් ටවුම පැත්තට යනවා පාල දැකලා.... එයා අපි ක්‍රිකට් ගහන තැනට දුවගෙන ආවා.

'ඒයි යකා ආච්චි කොහේද ගියා, හොඳට ඇඳගෙන බස් එකෙන්. අපි යමු ආත කන්න'.

ක්‍රිකට් ගැසීම නැවතූ මිතුරන් වත්තට යාමට මගක් සිතුවා. කවදත් ඔය වගේ වැඩට දක්‍ෂ විමල් කළ යෝජනාවට හැමෝම කැමති උනා.

සැලසුම් කළ පරිදි විමල් ගැසූ ඊළඟ බෝලය ගියේ සීයාගෙ වත්තට. පාල පෙරටු කර ගත් ක්‍රිකට් කණ්ඩායම ආත සීයා හොයාගෙන ගියා.

'සීයේ අපේ බෝලෙ මේ වත්තට ආවා. හොයා ගන්නද?'

'හා හා හොයා ගනිල්ල. ආච්චිත් දැන් ගෙදර නැහැ. එනකොට හවස් වේවි.... මං හිතන්නේ. ඒ නිසා ඉදිච්ච ආත ටිකකුත් කාපල්ලා. ඒත් ලෙලි එහෙම පේන්න දාන්න එපා. වත්ත පහල වලකට දාපල්ලා. ආච්චි දැක්කොත් මට විසුමක් වෙන්නෙ නැහැ.'

කොලු රැල වත්තට පැන්නේ සීයාට පින් දෙමින්. පැයක් විතර යන්න ඇති.

'ඒයි ආච්චිගෙ කට හඬ ඇහෙනවා ගේ ඇතුලෙන්. පොඩ්ඩක් ගිහිල්ල බලමු.' පාල තමයි කිව්වෙ.

කොලු රැන දුටු ආච්චිට ඔක්කොම අමතක උනා වගේ.

'මට හොඳ වෙලාවට නංගිගෙ මාලෙ ගෙනියන්න අමතක උනේ. නැත්නම් මුන් මගේ වත්ත කයි. හිටපල්ල මම උඹලට හොඳ වැඩක් කරන්නම් අද' කී ඇය සීයාට බැණ වදිමින් කොලු රැල පසු පස පන්නයි.

'ඒයි අන්න යකා ආච්චි රංගව අල්ල ගත්ත. අපි ආච්චිව බිම දාලා රංගව බේර ගනිමු.' පාල කිව්වා.

'එපා එපා පව්. අපි බලමු ආච්චි මොකද කරන්නෙ කියලා' කොලු රැලේම එකෙක් උත්තර දුන්නා.

'අ හා! උඹ තමයි එහෙනම් අර ලොකු ඉස්කෝලයගෙ පොඩි පුතා ආ... උඹෙ තාත්තා ඕවා වෙන්නැති ඉස්කෝලෙ උගන්වන්නේ. යමං මම හොඳ දෙකක් කියන්නම් උඹේ තාත්තට.' යැයි කෑ ගසමින් රංගව අල්ලාගත් ආච්චි ඔහුගේ ගෙදර දෙසට යයි. කොලු රැල ඇගේ පසු පසින් එන්නේ රංගව බේරාගන්න මාන බලමින්.

තාත්තා ඉස්තෝප්පුවේ පත්තරයක් බලමින් අම්මා හා නංගී සමග බර කතාවක. බය වී ඇති රංගද ඇද ගෙන එන ආච්චි දුටු තාත්තාගෙ කට කොණට හිනාවක් මතු විය.

'මොකද මොකද නැන්දෙ? මේ රංග මොනවද කළේ?'

'මොකද තමයි? මේ කොල්ලො ටික මගේ ආත ගස්වල ඔක්කොම ගෙඩි කාලා විනාස කරලා. මේකා මහත්තයගෙ පුතා නෙවි නම් මං දන්නව කරන වැඩේ.' තාත්තා දුටු ආච්චිගේ සැර බාල වී ඇත.

උඩ තිබූ වේවැල තාත්තා අතට ගන්නවා දුටු නංගී තාත්තාගේ අතේ එල්ලී අඬන්නට විය. ආච්චිටත් දුක හිතිලා වගෙයි.

'මහත්තයෝ පුතාටයි මේ කොල්ලො ටිකටයි කියලා දෙන්න හොරකම් කරන්න හොඳ නැහැ කියලා. අදට දඬුවම් කරන්න එපා.' අපි හැම දෙනාවම පුදුමයට පත්කරමින් ආච්චි කිව්වා. ආච්චි නැවත ගේ දෙසට ගියේ හැඬුම් බරව.

'ආ දැන් ඔක්කොම කියනවා බලන්න මොකද උනේ කියලා?' තාත්තා ඇහුවා.

'අපි බෝල ගහන කොට බෝලෙ ආත සීයාගේ වත්තට ගියා. බෝලෙ හොයන්න ගියාම සීයා කිව්ව ආච්චි ගෙදර නැහැ. ආත ටිකකුත් කාලා යන්න කියලා. ඉතිං අපි කෑවා. හොරෙන් නෙවි. සීයා කියපු නිසා. ඒත් අපි දන්නෙම නැහැ ආච්චි ගෙදර ඇවිල්ලා'.

වේවැල පැත්තකින් තැබූ තාත්තා හිනාව තද කර ගත්තා. ඒත් තාත්තාගෙ මූණ ටිකක් වෙනස් උනා.

'මීට පස්සෙ ඔය වගේ වැඩ කරන්න එපා. තේරුනාද? දැන් ගිහිල්ලා සෙල්ලම් කරන්න. ඊට පස්සේ එන්න මෙහාට අපි ඔක්කොටම රොටි හදල තියන්නම් ලුණු මිරිස් එක්ක' අම්මා සන්සුන්ව කිව්වා. අපි සැමටම දැනුනේ හරිම සහනයක්.

යකා ආච්චිගෙ වෙනස් වීම මට විතරක් නොවෙයි කොළු රැනටම ප්‍රශ්නයක් වෙලා තිබුනා... ඒ දවස්වල... පස්සෙ දවසක ඒ සිද්ධිය ගැන අපි ගෙදරදි කතාවෙන කොට අම්මා කියපු දේ මට තාම මතකයි.

යකා ආච්චිටත් පුතෙක් ඉඳලා තියෙනවා. තාත්තලත් එක්ක ඉස්කෝලෙ ගිය.... ඒ පුතා වයස අවුරුදු 10 - 12 වගේ කාලෙ දවසක් ආච්චි නැති වෙලාවක යාලුවොත් එක්ක හොරෙන් ආත කාලා ආච්චිට අහුවෙලා. ආච්චි පුතාට දඬුවම් කරන්න වේවැල අතට ගන්න කොට පුතා ගෙදරින් පැනලා. ඒ ගියා ගියාමයි පුතා ගැන කිසිම ආරංචියක් අද වෙනතුරු නැහැලු.

මේ සිද්ධිය නිසා වෙන්න ඇති එදා යකා ආච්චි, තාත්තා මට දඬුවම් කරන්න වේවැල අතට ගන්න කොට වෙනස් වුණේ කියලා මට හිතෙනවා.

'ඔන්න ඕක තමයි ඒ කතාව' කී රංග කී බෝඩ් එක දිහා බැලුවෙ නැවතත් කරමින් සිටි පොතේ වැඩේ පටන් ගන්න.

'ඉන්න රංග මං ඔයාට නෙස්ටොමෝල්ට් දාලා හොඳ තේ එකක් හදන් එන්නම්' කී ධම්මි නැගිට මුළුතැන් ගෙය දෙසට ගියා.

සැනසුම ජීවිතේ හැමදා ගෙන  දුන්න
ඔබ ලද පිනම මට අද හැක  විඳගන්න
පස් මහ බැලුම් නොබලා යළි  උපදින්න
නිති පින් කරමු භව සයුරෙන්  ජයගන්න

කවුදෝ ලියූ කවියක් රංග මිමිනුවේ තේ කෝප්පය ලැබෙන තුරු - හරිම සැහැල්ලුවෙන්!

**මහාචාර්ය ෂෙල්ටන් පීරිස්**
සිඩ්නි විශ්ව විද්‍යාලය

පසු සටහන:
මෙය මනකල්පිත ලෙස විකාහණය වුවත් සමහර චරිත අතීතයේ ජීවත් විය.